# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 74 දරන අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යය භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 දෙසැම්බර් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 5.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2009 අංක 74 දරන අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යය භාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 30/2007.

**අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යය භාරය සංස්ථාගත කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ එයට ආනුෂංගික සියලු කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.** පූර්විකාව.

අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යය භාරය යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන භාරයක් එකී භාරය සම්බන්ධ පරමාර්ථ ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා 1982 සිට මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී භාරය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී භාරයේ භාරකාර මණ්ඩලය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද :

එකී භාරකාර මණ්ඩලය සංස්ථාගත කරන ලෙස, එකී භාරකාර මණ්ඩලය විසින් ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 74 දරන අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යය භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යය භාරයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යය භාරය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යය භාරය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ වන්නේ—

(අ) අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා සූදානම් වන ශ්‍රී ලංකා මුස්ලිම් සිසුන්ට සහාය ලබා දීම ;

(ආ) යම් විශ්ව විද්‍යාලයක, ආයතනයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක අධ්‍යාපනය ලබන ශ්‍රී ලංකා මුස්ලිම් ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, වෘත්තීය මාර්ගෝපදේශකත්වය ලබා දීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික, තාක්ෂණික සහ වෘත්තීය දක්ෂතා නැංවීම ;

(ඇ) ශ්‍රී ලංකා මුස්ලිම් සිසුන්ගේ තාක්ෂණික අධ්‍යාපනය ඇතුළුව අධ්‍යාපන සංවර්ධනයට මාර්ගෝපදේශකත්වය සැපයීම සහ එයට සහාය වීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ යම් ඉස්ලාමීය ආයතනයක්, මුස්ලිම් පල්ලියක් හෝ අරාබි පාසල් පිහිටුවීම, ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම හෝ නවීකරණය කිරීම සඳහා ඉදිරිපත් වීම හා සහාය දැක්වීම හා එවැනි ආයතන නඩත්තු කිරීම පිණිස අඛණ්ඩ දායකත්වය සැපයීම ;

(ඉ) දිළිඳුකම පිටු දැකීමට කටයුතු සැලැස්වීම හා යම් ස්වභාවික ආපදාවකට ගොදුරු වූ මුස්ලිම් තැනැත්තන්ට සහාය දැක්වීම ; සහ

(ඊ) ඉහත සඳහන් අරමුණු සඳහා අරමුදල්, දායක මුදල් හා වෙනත් ප්‍රදානයක් එකතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල සංස්ථාවට ඇත්තේ ය :—

(අ) දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍ය වශයෙන් හෝ ප්‍රදාන, පරිත්‍යාග හා තෑගි මුදල් හා දායක මුදල් ලබා ගැනීම ;

(ආ) සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය කිරීමට හෝ තවදුරටත් පවත්වාගෙන යෑමට හෝ අවශ්‍ය යැයි සැලකෙන සියලුම ක්‍රියාවන් ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම හා වසා දැමීම ;

(ඈ) ඇප සහිතව හෝ රහිතව හෝ මුදල් ආයෝජනය කිරීම, ණයට ගැනීම හෝ සපයා ගැනීම ; සහ

(ඉ) සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන සේවකයන් බඳවා ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහ කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ රීතිවලට යටත්ව පාලනය කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ භාරකාර මණ්ඩලයේ ධුර දැරූ සාමාජිකයන් පළමුවන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් විය යුතු ය.

(3) සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි මණ්ඩලයේ සාමාජිකයකුගේ මරණය, අශක්නුතාවක් හෝ ඉල්ලා අස්වීමක් හේතුවෙන් ඇතිවන පුරප්පාඩු පිරවීමට මණ්ඩලයට බලතල තිබිය යුතු ය.

**6.** (1) මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ මණ්ඩලයේ රැස්වීම්වල ගණපූරණය ඇතුළු පහත දැක්වෙන සියලුම දේ හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, භාරයේ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් කලින් කල භාරය විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, පත් කිරීම හා ඉවත් කිරීම ;

(ආ) සංස්ථාවේ සාමාජිකයන් බඳවා ගැනීම, ඉවත් කිරීම හෝ පහ කිරීම ;

(ඇ) මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධාරීන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යයන් ඉටු කිරීම ;

(ඇ) මණ්ඩලයේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු පටිපාටිය ; සහ

(ඉ) සංස්ථාවේ අරමුදල් කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම.

(2) රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එය වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම ඒ ආකාරයෙන් ම කළ හැකි ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

භාරය විසින් ගෙවනු ලැබිය යුතු සහ භාරයට ලැබිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී පැවති භාරය විසින් ගෙවිය යුතු ව තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට භාරයට අයවිය යුතුව තිබූ සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල්, ප්‍රදාන සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංගමය විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ සංස්ථාව සතු බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී සංස්ථාව විසින් වියදම් කරන ලද සියලුම මුදල් භාර අරමුදලින් ගෙවිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, සෑම වර්ෂයක ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එවැනි ආයතනයක පාලන සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ව්‍යාපාරික ආයතනයක එක් එක් මාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ පාලන සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් තමා සතුව ඇත්තා වූ ද ගණකාධිකාරී ව්‍යාපාරයක්,

අදහස් වේ.

**10.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට 6 වන වගන්තිය යටතේ දෙනු ලබන රීතිවලට යටත්ව සංස්ථාවට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්යය සඳහා එකී රීතිවලට යටත්ව දැරිය යුතු ය. තව ද, සංස්ථාවේ රීතිවලට යටත්ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාව සතු වන්නේ ය.

සංස්ථාවට චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

සංස්ථාවේ මුද්‍රාව.

11. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනෙක් ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ අභිමතය පරිදි ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.